# 1.33 ක්‍රි. ව. 1750- 1900 දක්වා කාලයට අයත් දකුණු ගුරුකුලයේ විහාර බිතුසිතුවම්හි දක්නට ලැබෙන උප ශෛලීන්

ජේ. ඒ. වජිර නලින්ද ජයතිලක
දෘශ්‍ය කලා සහ ප්‍රාසංගික කලා ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

ශ්‍රී ලංකාවේ ගාල්ල, මාතර, කළුතර, කොළඹ, හම්බන්තොට සහ ගම්පහ දිස්ත්‍රික්ක ආශ්‍රිතව වෙරළබඩ තීරයේ ව්‍යාප්තව පැවති චිත්‍ර සම්ප්‍රදාය දකුණු ගුරුකුලය ලෙස කලා විචාරකයින් විසින් හඳුන්වනු ලබන අතර දකුණු ගුරුකුලයේ ද උප ශෛලීන් ගණනාවක් දක්නට ලැබේ. එහෙත් එම ශෛලීය විශේෂතා පිළිබඳ සප්‍රමාණික අධ්‍යයනයක් මෙතෙක් සිදුව නොතිබීම දුබලතාවක් වන අතර දකුණු ගුරුකුලයේ සිතුවම්හි ප්‍රධාන ශෛලීන් පහක් පමණ හඳුනාගත හැකි ය. ද්විතීක මූලාශ්‍ර මත පදනම් වූ කාල නිර්ණයන්ට අනුව ඒවා පහත පෙළ ගස්වා ඇත. එසේ ම මෙහි දී එක ම කාල පරාසයක දී ශෛලීන් කිහිපයක් භාවිත වූ අයුරු ද හඳුනාගත හැකි ය.

**පළමු ශෛලිය-** **ක්‍රි. ව. 18 සියවසේ අග සහ 19 සියවසේ මුල භාගය**
පොල්වත්ත ගංගාරාමය, පුලිනතලාරාමයේ පැරණි නාථ දේවාලය,
තෙල්වත්ත පැරණි විහාරය

**දෙවන ශෛලිය-** **ක්‍රි. ව. 18 සියවසේ අග සහ 19 සියවසේ මුල භාගය**
මුල්ගිරිගල රජමහා විහාරය

**තෙවන ශෛලිය-** **ක්‍රි. ව. 1830-1860**
කෝට්ටේ රජමහා විහාරය, කැලණිය රජමහා විහාරය,
ඇතගම සුමනාරාමය, දොඩම්දූව ශෛලබිම්බාරාමය,
තෙල්වත්ත අළුත් විහාරය, හික්කඩුව ජනනන්දාරාමය

**සිව්වන ශෛලිය-** **ක්‍රි. ව. 1860-1890**
කතලුව පූර්වාරාමය, දොඩම්දූව කුමාර මහා විහාරය, සමුද්‍රගිරි විහාරය,
නවමුණි සෑ පුරාණ විහාරය, මුල්ගිරිගල පදුම රහත් ලෙනේ චිත්‍ර

**පස්වන ශෛලිය-** **ක්‍රි. ව. 1880 පසු**
පානදුර රන්කොත් විහාරය, සපුගොඩ ශ්‍රී මහා විහාරය,
කරගම්පිටිය සුබෝධාරාමය

මෙහි සඳහන් පළමු ශෛලිය මධ්‍යම මහනුවර ශෛලියට සමාන ලක්ෂණ පළ කරන අතර මධ්‍යම මහනුවර කොට්ටල්බද්දේ ශිල්පීන්ගෙන් පැවතගෙන ආ සිත්තර පරම්පරා මෙම ශෛලිය අනුගමනය කළ බව සිතිය හැකිය. සරල-ද්විමාන ශෛලීගත මානව සහ සත්ත්ව රූප, අත්‍යවශ්‍ය අවම වස්තු පමණක් භාවිත කිරීම, සාම්ප්‍රදායික රතු පසුබිම, සිහින් සමාන්තර රේඛා මගින් ඇඳුම්වල රැලි දැක්වීම, සරල ආකෘතික සංරචනය, මධ්‍යම මහනුවර ශෛලියේ සාම්ප්‍රදායික අවකාශය පිරවීමේ මල් මෝස්තර ආදිය මෙම ශෛලියේ දී සුලභ ය.

පළමු ශෛලිය හා සමකාලීන ව පවතින්නට ඇතැයි අනුමාන කෙරෙන මුල්ගිරිගල පැරණි විහාරයේ චිත්‍ර ද එයට ම ආවේණික ශෛලීය ලක්ෂණ රැසක් ප්‍රකට කරයි. සාම්ප්‍රදායික රතු පසුබිම වෙනුවට යොදා ඇති ලා දුඹුරු පැහැති පසුබිම, රූපාවලියේ වර්ණ මාලාව දුඹුරු පැහැය මුල් කොටගෙන ගොඩනගා තිබීම, කහ- කොල - නිල් පැහැයන් ඉතා අවම වශයෙන් භාවිත කිරීම, රූප අලංකරණයට පළල් සමාන්තර රේඛා භාවිත කිරීම, මුල්ගිරිගලට ම ආවේණික ශාකපත්‍ර අලංකරණ රටා-රූප සම්පිණ්ඩනය මෙන් ම ඇඳුම් සහ ගෘහ අලංකරණ රටා ද කැපී පෙනේ. මෙම ශෛලියට සමාන සිතුවම් අන් කිසිදු ස්ථානයකින් හමු නොවීම ද විශේෂත්වයකි.

කෝට්ටේ රජමහා විහාරය, කැලණිය රජමහා විහාරය ආදියෙහි ප්‍රචලිත සිතුවම් 19 වැනි සියවස මැද භාගයේ දී වඩාත් ජනප්‍රිය ම පහතරට සිතුවම් ශෛලිය වූ බව පෙනේ. මධ්‍යම මහනුවර ශෛලියේ ඇඳුම්වල ඒකාකාර රැලි රටා වෙනුවට විසිතුරු මල් සහ කොළ රටාවලින් අලංකාර වූ පහතරට ප්‍රචලිත යුරෝපීය ඇඳුම් පැළඳුම්වල ලක්ෂණ ද සහිතව වස්ත්‍ර නිම වුණි.

ගොඩනැගිලි හා ගෘහ භාණ්ඩ සරල ආකෘතියක් ගත්ත ද ඉන් බහුතරයකට යුරෝපීය ආභාසය සහිත මෝස්තර එක් විය. පසුබිමට රතු මෙන් ම කළු පැහැය ද ආදේශ වූ අතර අවකාශය පිරවීමට යොදන සම්මත මල් සැරසිලිවලට අමතරව යුරෝපීය බැරොක් හා රොකෝකෝ මෝස්තර ඇසුරින් කළ අවකාශ පිරවුම් රටා ආදේශ විය. දොඩම්දූව ශෛලබිම්බාරාමයේ සිතුවම් තෙවැනි ශෛලියේ ම සිතුවම්වල සංකීර්ණ සැරසිලි සහිත අවස්ථාවක් බව පෙනේ.

සිව්වැනි ශෛලියේ දී ශිල්පීන්ගේ වර්ණමාලාව පුළුල් වී වඩාත් දීප්තිමත් සහ විචිත්‍රවත් විය. එතෙක් සුලභ නොවූ ලා රෝස, දම්, ලා නිල් භාවිතයට පැමිනුණි. එසේ ම සිතුවම් ඇඳි තීරුව සම්පූර්ණයෙන් ම මානව, සත්ත්ව, ශාක සහ මෝස්තර රටාවලින් පුරවා ඇති හෙයින් රූප බාහුල්‍යය මෙම ශෛලියේ දී කැපී පෙනේ. එතෙක් පැවති ද්විමාන රූප වෙනුවට මඳ ඝනත්වයක් දැක්වීම, නාටකීය ආකාරයෙන් අවස්ථා නිරූපණය, රෝස මල් මිදි වැල් මෝස්තර සුලභ ව එකතු කිරීම, ගස් වඩාත් ස්වභාවිකරූපී වීම, ගොඩනැගිලි පර්යාවලෝක රීතියට අනුරූපව ඇඳීමට උත්සාහ කිරීම, ගෘහභාණ්ඩ සහ ගොඩනැගිලි යුරෝපීය අලංකරණ රටා බහුලව යොදා ගනිමින් බෙහෙවින් විස්තරාත්මක ව විසිතුරු කිරීම සහ රූපවල ක්‍රියාකාරී ඉරියව් බහුල වීම මෙම ශෛලියේ දී දැකිය හැකිය. කඩොල්ගල්ලේ සිත්තර ගුරුකුලය වඩාත් පරිණත අයුරින් මෙම ශෛලිය භාවිත කර ඇත.

19 වැනි සියවසේ අග භාගයේ දී බටහිර ස්වභාවිකවාදී චිත්‍ර කලාව ප්‍රබලව අනුකරණය කරමින් නව ශෛලියක් ව්‍යාප්ත වූ අතර කරගම්පිටිය සුබෝධාරාමයේ උම්මග්ග ජාතකය, පානදුර රන්කොත් සහ සපුගොඩ ශ්‍රී මහා විහාරවල අන්තරාලයේ චිත්‍රවලින් මෙය හොඳින් පැහැදිලි වේ. රූපවල ඝනත්වය සහ ත්‍රිමාණරූපී බව වඩාත් පැහැදිව දැක්වීම සහ පර්යාවලෝක මූල ධර්මයට අනුව ඇඳි සංකීර්ණ යුරෝපීය ගොඩනැගිලි සැලසුම් මෙහි කැපී පෙනේ. තව ද පසුබිම පිරවීමට යෙදූ සාම්ප්‍රදායික මෝස්තරවලින් සපුරා නිදහස් වී ඒ වෙනුවට ස්වභාවික වස්තූන් ම යොදන ලද අතර වර්ණ එකිනෙක මිශ්‍ර කරමින් බහුවිධ වර්ණ ප්‍රභේද සුලභ ව භාවිත කර ඇත. මෙය එතෙක් පහතරට දක්නට ලැබුණු පොදු ශෛලීගත ආකෘතියෙන් ඉවත්ව ලාංකේය සිතුවම් කලාව බටහිර ස්වභාවිකවාදී ආකෘතියට නැඹුරු වීමේ අන්තර් සංක්‍රමණ අවස්ථාවක නියෝජනයක් ලෙස ද හැඳින්විය හැකි ය.

මේ අනුව දකුණු ගුරු කුලයේ පැහැදිලිව හඳුනාගත හැකි උප ශෛලීන් ගණනාවක් ඇති අතර කාලානුරූපව සැසඳීමේ දී මුල් කාලීනව මධ්‍යම මහනුවර ලක්ෂණ පළ කළ ශෛලීන් පසුකාලීනව බටහිර කලා ලක්ෂණ අනුකාරක ශෛලීන් බවට අනුවර්තනය වීම දැකිය හැකි ය. දකුණු ගුරු කුලයේ ශෛලීය වෙනස්කම් කෙරෙහි 1815 දී ලංකාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක් වීම, කොට්ටල්බද්ද බිඳ වැටීම, රාජකාරී ක්‍රමය අහෝසි වීම, බටහිර අධ්‍යාපනය පැතිරීම, උසස් මධ්‍යම පාන්තික අනුග්‍රාහකයින් පිරිසක් බිහි වීම, බටහිර සිත්තරුන්ගේ ආගමනය, පුවත්පත් පැතිරයාම, නාගරික කලා සංගම්, යුරෝපීය නාට්‍ය සහ සංදර්ශන පැතිරීයාම ආදී තත්කාලීන සමාජීය, ආර්ථික, දේශපාලන, සංස්කෘතික සාධකයන්හි වෙනස් වීම බලපා ඇති බව පෙනේ.